# සංවර්ධන ලොතරැයි මණ්ඩලය

DLB DEVELOPMENT LOTTERIES

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

## (1997 අංක 20 දරන පනත යටතේ ස්ථාපිත කරන ලදි)

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පවතින පහත තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**

| | | |
|---|---|---|
| තනතුරු නාමය | : | ප්‍රධාන ආරක්ෂක නිලධාරී |
| පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | : | 01 |
| වැටුප් කේතය | : | JM 1-1-2025 |
| වැටුප් පරිමාණය | : | රු. 72,650 - 10 X 1,360 - 18 X 2,040 - 122,970<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025) |
| මාසික කොන්ත්‍රාත් වැටුප | : | JM 1-1 2025 වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවර වන රු. 69,387/-ක් හා මුදල් අමාත්‍යාංශය මගින් අනුමත කළ අනෙකුත් දීමනා |

**02. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 01, 02 හෝ 03)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමග රාජ්‍ය ආරක්ෂක අංශයේ මාණ්ඩලික මට්ටමේ තනතුරක වසර 03ක පශ්චාත් සේවා පළපුරුද්ද.

**හෝ**

(2) ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතුව සිට විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගිය මේජර් තනතුර හෝ ඉන් ඉහළ තනතුරක් දැරූ නිලධාරියෙකු වීම.

**හෝ**

(3) පොලිස් සේවයේ විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගිය සහකාර පොලිස් අධිකාරි තනතුර හෝ ඉන් ඉහළ තනතුරක් දැරූ නිලධාරියෙකු වීම.

**වයස :** අවු 22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**03. මූල්‍ය ප්‍රතිලාභ**

I. කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛයේ JM 1.1 තනතුරට නියමිත වැටුප

II. මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා (දිරි දීමනා, පැමිණීමේ දීමනා, ප්‍රවාහන දීමනා, ජීවන වියදම් දීමනා... )

III. සේවක අර්ථසාධක අරමුදලට 15% ක් හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට 3%ක් ආයතනය මගින් ගෙවනු ලැබේ.

IV. මසකට රු. 125,000/- ක් පමණ උපයා ගැනීමට හැකියාව ඇති අතර, එය මාසිකව වෙනස් වනු ඇත.

**03. පොදු කොන්දේසි :-**

I. **පත්වීමේ ස්වභාවය** :- කොන්ත්‍රාත් පදනම මත

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

II. **වෙනත්** :- සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

III. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල (වාචික / ලිඛිත හෝ ප්‍රායෝගික ඉදිරිපත් කිරීමේ පරීක්ෂණ) මත බඳවා ගනු ලැබේ.

IV. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :- 2025.06.05**

සියලු අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් දක්වන සහතික හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකවල, සහතික කරන ලද පිටපත් සමග අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ලද අයදුම්පත්‍රයක් 2025.06.05 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. නැතහොත් අයදුම්පත් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මානව සම්පත් හා පරිපාලන අංශයේ තබා ඇති පෙට්ටියට ගෙනවිත් බහාලිය යුතු වේ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / අනෙකුත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**සංවර්ධන ලොතරැයි මණ්ඩලය,**
**අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,**
**යූනියන් පෙදෙස, කොළඹ 02.**